ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

වාර්ෂික වාර්තාව 2016

පටුන

මාතෘකාව	පිටු අංකය
දැක්ම සහ මෙහෙවර	2
අධ්‍යක්ෂ මණ්ඩලය	3
සභාපතිතුමාගේ සමාලෝචනය	5
මණ්ඩලයේ තොරතුරු	6
සමස්ථ කාර්ය සාධනය 2016	7
වාර්ෂික ගිණුම් වාර්තාව	13
විගණකාධිපති වාර්තාව	34

2016 - වාර්ෂික වාර්තාව

දැක්ම

ගොවි ජනතාවගේ සහ අඩු වරප්‍රසාද ඇති ජනතාවගේ අභිමානය නැවතත් ඇති කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මගින් ආර්ථික ස්වාධීනත්වය සහ ස්ව විශ්වාසය ඇති කිරීම'

මෙහෙවර

ප්‍රතිලාභීන් ගේ ආර්ථික ස්වාධීනත්වය ඇති කිරීමටත් අනුන් මත යැපීමේ සංස්කෘතිය මග හැරවීම සඳහාත් කෘෂිකර්ම, පශු සම්පත් සහ වෙනත් ක්ෂේත්‍ර වල නිපුණතා සංවර්ධනය සඳහා සහභාගීත්ව සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

2016 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය

නම	තනතුර	සේවා ස්ථානය
ධම්මික පීරිස් මහතා	සභාපති	ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
රවී ක්‍රිෂාන් ජයවර්ධන මහතා	උප සභාපති	ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
කේ. මහේසන් මහතා	අතිරේක ලේකම් (සංවර්ධන)	ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ඩබ්.එම්. දීප්ති ප්‍රනාන්දු මහත්මිය	අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)	ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යාංශය
පී.එස්.එස් විජේරත්න මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	කෘෂිකර්ම අමාත්‍යාංශය
එච්.ජී.ජී.ජේ ධර්මසේන මහතා	අධ්‍යක්ෂ ජනරාල්	මිනිස් බල හා රැකි රක්ෂා දෙපාර්තමේන්තුව
ඩබ්. ඒ. ඩී. ඩී. එම්. ප්‍රියන්ත මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
විජයසිරි වික්‍රමසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක 409/3සී, මහයියාවවත්ත, කලපුවාව, මුල්ලේරියාව නගරය
පී.ඩබ්.ධර්මසිරි වැලිකල මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක95, බණ්ඩාරනායක මාවත, මිහිඳුපුර, අනුරාධපුර
ඒ.ටී.එම්. ඒකනායක මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක 121, යසසිරිපුර, අනුරාධපුර
ක්‍රිෂාන් නිලංග මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	898/ ඒ4, දියතෙර,පහලවෙල පාර, පැල්වත්ත

2016 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වූ දිනයන්

367 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2016.04.05

368 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2016.06.09

369 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2016.07.28

370 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2016.08.31

371 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2016.09.29

372 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2016.11.10

373 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2016.12.29

2016 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල පැවැත්වූ දින ගණන = 07

සභාපතිතුමාගේ සමාලෝචනය.

ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ සභාපති ලෙස 2016 වසරේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් සමාලෝචනාත්මක කාර්ය සාධනයක් ඉදිරිපත් කරනු ලබනුයේ හද පිරි සතුටිනි.

අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ වස විසෙන් තොර දේශීය කෘෂි ආර්ථිකයක් මගින් කෘෂිකර්මාන්තයේ තිරසාර සංවර්ධනක් යන සංකල්පය පෙරදැරි කොටගෙන වස විසෙන් තොර සෞඛ්‍යමත් දේශීය ආහාර ප්‍රවර්ධනය උදෙසා කටයුතු කරමින් සිටිනු ලබන අතර මේ සඳහා ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක මැතිතුමාගේ මග පෙන්වීම හා ආශිර්වාදය අප හට මහගු අත්වැලකි.

2016 වසර සඳහා අප මණ්ඩලය මගින් පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති සිදු කරන ලදී.

1. වස විස නැති අපේ ආහාර - හෙල්දි ෆුඩ් වෙළඳ සැල් ජාලය
2. බඩ ඉරිගු ගොවින් දිරිගැන්වීමේ ව්‍යාපෘතිය
3. දේශිය ආහාර ප්‍රචලිත කිරීමේ"සිතමු-2016" ආහාර සැණකෙළිය
4. සහල් බලකරණ ව්‍යාපෘතිය
5. ගෙවතු වගාවට අත්වැලක්-මිරිස් පැල බෙදා හැරීම
6. ඌන භාවිත පළතුරු භාවිතා කරමින් (Ready to serve drink) පලතුරු බීම නිෂ්පාදනය
7. මව්පෝෂ සහ සුවපෝෂ පෝෂණීය ආහාර නිෂ්පාදනය සහ ප්‍රවර්ධන ව්‍යාපෘතිය
8. බුත්තල සහ තණමල්විල ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය
9. ගොවි නිෂ්පාදන අලෙවි සැල් ව්‍යාපෘතිය
10. දේශීය පාරම්පරික සහල් නිෂ්පාදන හා පරිභෝජනය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය

මෙම ප්‍රධාන ව්‍යාපෘති වලට අමතරව නූතන අවශ්‍යතා වලට ගැලපෙන පරිදි නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා වෙත උපරිම සාධාරණයක් ලබාදීම උදෙසා දෙහිවල සහ නාරාහේන්පිට ගොවි නිෂ්පාදන අලෙවි සැල් පිහිටුවා ඇති අතර එමගින් නාගරික ප්‍රජාව සඳහා සෙත සැලසීම ද සිදුවේ. එසේම දෙහිවල සහ නාරාහේන්පිට නාගරික ප්‍රදේශවල පවත්වාගෙන යන පැළ තවාන් මගින් නාගරික ජනතාව සඳහා අඩු ඉඩකින් උපරිම ඵලදාවක් ලැබෙන පරිදි කෘෂි බෝග වගා කිරීමේ ක්‍රම හා එළවළු, මල් වර්ග, ඖෂධ පැළ සහ පළතුරු පැළ වර්ග සහන මිලට ලබා දීමටත්, වගාවන් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම ද සිදු කරයි.

එසේම අපගේ කලංකුට්ටිය සහ ගන්නෝරුව පිහිටි නිෂ්පාදනාගාර මගින්, වස විස නැති පාරම්පරික දේශිය සහල්, තෝසේ පිටි, විශේෂිත සහල් පිටි, මව්පෝෂ, සුවපෝෂ, සිසුපෝෂ වැනි නිෂ්පාදන රැසක් සිදු කරන අතර මෙම නිෂ්පාදන වෙළඳපලට ඉදිරිපත් කිරීමට ද හැකියාව ලැබී ඇත.

එසේම විවිධ පර්යේෂණ ආයතන මගින් නව ආහාර වර්ග එළි දක්වනු ලබන නමුත් ඒවා ප්‍රවර්ධනය සඳහා කිසිදු රජයේ ආයතනයක් ඉදිරිපත්වීම විරල සිදුවීමක් වේ. ඒ අනුව එම කාර්යය සිදු කිරීමේ මූලික පියවරක් ලෙස ජනතාව අතරට වස විස නැති දේශිය ආහාර මිලදී ගැනීමට හැකි වන පරිදි හෙල්දි ෆුඩ් වෙළඳ සැල් 100ක ජාලයක් ලංකාව පුරා ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

එමගින් පාරම්පරික වස විසෙන් තොර දේශිය ආහාර වර්ග ජනතාව අතර ප්‍රචලිත කිරීමත් එමගින් සුළු නිෂ්පාදකයින් වෙත උපරිම ආදායමක් ලබා දීමත් සිදු කරනු ලබන අතර ජනතාවගේ පෝෂණ තත්වය ඉහල නැංවීම සඳහා දායකත්වයක් ද ලබා දේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩ ඉරිගු නිෂ්පාදනය කරන ගොවින් හට ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා දීම අරමුණු කරගෙන බඩ ඉරිගු ගොවින් දිරිගැන්වීමේ ව්‍යාපෘතිය හරහා අප ආයතනය විසින් එම අස්වනු සාධාරණ මිලකට මිලදී ගැනීම සිදු කරයි.

එසේම මෙම කාර්යයන් පුළුල් කර ඉදිරියේදී වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරිමත් නව නිෂ්පාදන හඳුන්වා දීමත් ඒවා ජනතාව අතර සුලභ කිරීමත් එමගින් නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට සෙත සැලසීමත් යනාදී කරුණු මුල් කොටගෙන කටයුතු කිරිමට බලාපොරොත්තු වේ.

ධම්මික පිරිස්,
සභාපති,
ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය.
(ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

මණ්ඩලයේ තොරතුරු

මණ්ඩලයේ නම:
ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය (ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය)

පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය:
1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ පනත මගින් ස්ථාපිත කර ඇත. 2009 වසරේ ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය ලෙස නම වෙනස් කිරීමට කැබිනට් අනුමැතිය ලැබුනි. ප්‍රධාන කාර්යාලය කොළඹ 5, කිරිමණ්ඩල මාවතේ අංක 45හි පිහිටා ඇත.

මූලික ක්‍රියාකාරකම් සහ අරමුණු:
ප්‍රධාන ලෙස ආර්ථික අසාධාරණත්වයට භාජනය වූ ජනතාවට සේවය සපයන ආයතනයකි. අරමුණු වන්නේ;

- රජය විසින් සකස් කරන ලද සංවර්ධන වැඩ පිළිවෙලට අනුකූලව සාමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා විදේශීය, දේශීය නියෝජ්‍යාත්ව වල ආධාර ලබා ගැනීම
- මහජනෝපකාර සාමාජීය හා ආර්ථික සංවර්ධනය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම
- කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය කෙරෙහි යොමු වූ නිශ්චිත යෝජනා ක්‍රමවලට ආධාර කිරීම එම යෝජනා ක්‍රම දියුණු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම
- කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ යෝජනා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යාත්ව උනන්දු කිරීම
- ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාරය සහ වෙනත් ඒ හා සමාන පිටරට ආයතන, සංගම් හෝ සමිති සමග සහයෝගී වීම

රේඛීය අමාත්‍යාංශය
කෘෂිකර්ම අමාත්‍යාංශය

කාර්යාලය:
අංක 45, කිරිමණ්ඩල මාවත, කොළඹ 5.
දුරකථනය: 0112506895/0113085378
ෆැක්ස්: 0112506907
ඉ. ලිපිනය: ffhc.srilanka@gmail.com

විගණකවරු:
විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවන්:

ලංකා බැංකුව	-	බොරැල්ල
මහජන බැංකුව	-	දෙහිවල

උපාය මාර්ග:

- සංවර්ධන මූලයන් සාමූහික අරමුණක් කෙරෙහි යොමු කිරීමට සමෝධානය කිරීම
- ගැමි ජනතාවට ආර්ථික සහ සමාජ වර්ධනයට, සහයෝගී වීම සඳහා අවස්ථාව ලබා දීම
- සංවර්ධන ක්‍රියාවලියට සහභාගීවීම සඳහා ගැමි ජනතාවට බලය ලබා දීම
- ස්වයං ප්‍රචලිත තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා පාරම්පරික ගැමි ජනතාවගේ ස්ව විශ්වාසය ඇති කිරීම සමග ලබා ගත හැකි අගයයන් වෙත වෙනස් කිරීම
- දේශීය ආහාර භාවිතය සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම
- පසු අස්වනු හානිය අවම කිරීමේ තාක්ෂණය බිම් මට්ටම තෙක් රැගෙන යාම

සමස්ථ කාර්ය සාධනය - 2016

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය 2016 වසරේදී ව්‍යාපෘති 13ක් ක්‍රියාත්මක කර ඇති අතර මෙම ව්‍යාපෘති වල සංක්ෂිප්ත විස්තර පහත දැක්වේ.

1. පැළ අලෙවි සැල - නාරාහේන්පිට

නාගරික වැසියන්ගේ ගෙවතු වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය පහසු මිලට මිලදී ගැනීමට අවස්ථාව සැලසීම සඳහා මෙම පැල තවාන නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ ආරම්භ කරන ලදී. සියළු වර්ග වල මල් පැළ, ඌන භාවිත පලතුරු පැළ, එළවළු පැළ හා බීජ වර්ග මෙම තවානෙන් මිලදී ගත හැක.

මීට අමතරව එළවළු හා මල් පොහොර, කාබනික පොහොර, කෘමි විකර්ෂක, කෘෂි උපකරණ ආදිය මෙම ස්ථානයෙන් මිලට ගත හැකි අතර එසේම මෙම ස්ථානයෙන් බෝග වගා පිළිබඳ උපදෙස් ද නොමිලේ ලබා ගත හැක. මෙම වසරේ මෙම ව්‍යාපෘතිය සඳහා මෙහෙයුම් වියදම රු. මි 7.696 වන අතර මෙහෙයුම් ආදායම ලෙස රු. මි. 9.504 ලබාගෙන ඇත. එසේම වසරේ ශුද්ධ ලාභය රු. මි.1.465 කි. මෙම දත්ත අනුව පසුගිය වසරට වඩා මෙම ව්‍යාපෘතිය ප්‍රගතියක් ලබා ගෙන ඇත.

(පැළ තවාන හා පාරිභෝගිකයින් හට නොමිලේ උපදෙස් ලබා දීම)

2. පැළ තවාන - දෙහිවල

නාගරික වැසියන්ට ගෙවතු සංවර්ධනය සඳහා අවශ්‍ය සියළුම යෙදවුම් පහසු මිලට ලබා දීම සඳහා මෙම අලෙවි සැල ආරම්භ කරන ලදි. මෙම පැල තවාන මගින් සියළු වර්ග වල මල් පැල, දුර්ලභ වර්ගයේ පලතුරු පැල, එළවළු පැල හා බීජ වර්ග මිලදී ගත හැක. මීට අමතරව එළවළු හා මල් පොහොර, කාබනික පොහොර, කෘමි විකර්ෂක, කෘෂි උපකරණ ආදිය මෙම ස්ථානයෙන් මිලදී ගත හැකිය. මෙම වසරේ මෙහෙයුම් ආදායම ලෙස රු.මි 4.275 උපයා ඇති අතර රු.මි 3.796 ක මෙහෙයුම් වියදමක් දරා ඇත.රු.මි 1.309ක ශුද්ධ ලාභයක් ලෙස ලබාගෙන ඇත.

3. ගොවි නිෂ්පාදන අලෙවි සැල - දෙහිවල

නාගරික ජනතාවට අඩු ඉඩකින් වැඩි අස්වැන්නක් ලබා ගැනීම හා ජනතාව අතර වස විස නැති ආහාර ප්‍රචලිත කිරීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම වෙළඳ සැල තුලින් දේශීය නිෂ්පාදකයින් සකස් කල ආහාර නිෂ්පාදන, පාරම්පරික සහල් වර්ග හා අප ආයතනය විසින් නිෂ්පාදනය කරන මව්පෝෂ, සුවපෝෂ, තෝසේ පිටි සහ විශේෂ සහල් පිටි යනාදිය මිලට ගැනීමට හැක. මීට අමතරව දේශීය ආකාරයට සැකසූ උදෑසන හා දිවා ආහාර පහසු මිලට ගැනීමට අවස්ථාව උදාකර ගත හැක. දෙහිවල සත්වෝද්‍යානය තුලද මෙවැනි අලෙවි සැලක් පිහිටුවා ඇත.මෙම අලෙවි සැල් මගින් පාරිභෝගිකයින්ට අවම මිලකට ගුණාත්මක ආහාර සැපයීම සිදු කරයි. මෙම වසරේ මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම රු. මි 42.57 කි. මෙහෙයුම් ආදායම රු. මි. 42.421 කි. ඒ අනුව වසරේ ශුද්ධ ලාභය රු. මි 0.245 කි.

4. බුත්තල ගොවිපල සංවර්ධනය

මෙම ව්‍යාපෘතිය 1986 වසරේ ආරම්භ කල අතර ගොවින් හා ගෙවිලියන් මෙම ගොවිපල තුල වගා කටයුතු සඳහා පුහුණු කරවා ඇති අතර පසුකාලීනව කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් ද පවත්වන ලදි. 2016 වසරේ ප්‍රධාන ලෙසම බුත්තල ගොවිපලේ සිදු කරනු ලැබුවේ කාබනික පොහොර නිෂ්පාදනය කිරිමයි. මෙම වසරේ මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු. මි.9.16 ක් වන අතර මෙහෙයුම් වියදම රු. මි 1.09ක් වේ. ඉදිරියේ දි කාබනික පොහොර වලට අමතරව කොහුබත් හා බදුන් මිශ්‍රණ ද නිෂ්පාදනය කර අප ආයතනයේ අලෙවිසැල් හරහා ජනතාව වෙත සහන මිලට ලබා දිමට බලාපොරොත්තු වේ.

5. තණමල්විල ගොවිපල සංවර්ධනය

තණමල්විල ගොවිපලද කාලයක් තිස්සේ සුළු පරිමාණයෙන් වගා කටයුතු පවත්වාගෙන යන අතර ඉදිරියේ වසරේ සිට කාබනික පොහොර නිෂ්පාදනය ආරම්භ කිරිමට බලාපොරොත්තු වේ.

6. හෙල්දි ෆුඩ් භෝජනාගාරය – නාරාහේන්පිට

මෙම ව්‍යාපෘතිය 2014.04.01 දින නාගරික පාරිභෝගිකයන් වෙත පහසු මිලට දේශීය ආහාර සැපයීම අරමුණු කොට ගෙන ආරම්භ කරන ලදී. මෙහිදි දේශිය වට්ටෝරු වලට අනුව ආහාර පිළියෙළ කරන ලදි. මීට අමතරව ආයතනය විසින් සුළු හා මධ්‍යම ව්‍යවසායකයන් නිෂ්පාදනය කරන ලද දේශිය නිෂ්පාදන ද අලෙවි කරනු ලබයි. 2016 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු.මි 11.015 ක් වූ අතර මෙහෙයුම් වියදම රු.මි 14.634 ක් වේ. එසේම මෙම ව්‍යාපෘතියට අදාළ 2016 වර්ෂයේ ශුද්ධ අලාභය රු.මි 3.812 ක් වේ.දිගින් දිගටම මෙම ව්‍යාපෘතියෙන් අලාභ ලබන බැවින් නැවත ප්‍රතිසංවිධානය කර ලබන වසරේ සිට ලාභ ලබන පරිදි වෙනත් මුහුණුවරකින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිතය.

7. සුවපෝෂ පෝෂණීය ආහාරය, සහල් පිටි, තෝසේ පිටි, මව්පෝෂ ව්‍යාපෘතිය

වතුකරයේ සහල් පිටි භාවිතය ප්‍රචලිත කිරීමේ අරමුණින් සහල් පිටි සහ තෝසේ පිටි ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර මෙම ව්‍යාපෘතිය කලංකුට්ටිය කර්මාන්ත ශාලාව තුල ක්‍රියාත්මක වේ. මව්පෝෂ, සුවපෝෂ, සහල් පිටි, තෝසේ පිටි ව්‍යාපෘතිය අඩු බර ගර්භනී කාන්තාවන්ට පෝෂණ මල්ලක් සැපයීම අරමුණු කර ගනිමින් මහින්ද චින්තන සංකල්පයට අනුව ආරම්භ කරන ලදි. මෙම නිෂ්පාදන කටයුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආහාර පර්යේෂණ ඒකකයේ හා කලංකුට්ටිය කර්මාන්ත ශාලාවේදී නිෂ්පාදනය කරනු ලබයි.

8. බඩ ඉරිගු ගොවින් දිරිගැන්වීමේ ව්‍යාපෘතිය

අතිරේක ආහාර බෝග ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩ ඉරිගු ගොවින් දිරිගැන්වීමේ අරමුණින් මෙම ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි. මෙහි මූලික අරමුණ වන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් අනුමත කල බීජ වර්ග ගොවින් අතර ප්‍රචලිත කිරිමත් වගාවන් සඳහා පාංශු සංරක්ෂණ ක්‍රම පිළිබඳ ගොවින් දැනුවත් කිරිම මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩ ඉරිගු අස්වැන්න ඉහල නැංවීම වේ.මෙහිදි ගොවි සංවිධාන හරහා අප ආයතනයේ නිළධාරින්ගේ අධීක්ෂණය යටතේ බඩ ඉරිගු මිලදී ගැනීම සිදු කර ඇත. මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම රු. මි 16.08 කි. ආදායම රු. මි. 16.14 කි. ඒ අනුව වසරේ ශුද්ධ ලාභය රු. මි 0.11 කි.

(ගොවි සංවිධාන වලින් බඩ ඉරිගු මිලදි ගෙන ඔවුනට චෙක් පත් ලබා දීම)

9. සහල් බලකරන නියමු ව්‍යාපෘතිය

නිරෝගී ජීවිතයක් තහවුරු කිරීම හා සියළු දෙනාම සෑම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සහ කුසගින්න තුරන් කිරිම ,ආහාර සුරක්ෂිතතාව හා ,ඉහළ පෝෂණයක් අත්පත් කරගැනීම සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහල් බලකරණ නියමු ව්‍යාපෘතිය ජනාධිපති ලේකම් කාර්යාලයේ මෙහෙය වීම යටතේ ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ලෝක ආහාර සංවිධානයේ මූල්‍ය දායකත්වයෙන් ක්‍රියාත්මකකරන ලදි.

අප මණ්ඩලය හා පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් සංවේදන පරීක්ෂාවක් මොණරාගල හා මහනුවර පාසල් ළමුන් සඳහා ක්‍රියාත්මක කරන ලදී .ශ්‍රී ලංකාවේ සහල් ප්‍රධාන ආහාරය වන අතර එයට යකඩ සහ ෆෝලික් අම්ලය එක් කර බල ගන්වා එමඟින් රක්තහීනතාවය අවම කර නිරෝගී ජාතියක් බිහි කිරිම මෙම නියමු ව්‍යාපෘතියේ අරමුණු වූ අතර මේ සඳහා රු.මි 0.479 ක මුදලක් ලෝක ආහාර සංවිධානයෙන් ලැබුණු අතර රු.මි 0.12 ක් මෙම වසරේ වියදම් කර ඇත. මෙම ව්‍යාපෘතිය ලාභ ඉපයිමේ අරමුණින් නොව පෝෂණය ඉහළ නැංවීමේඅරමුණින් නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරයි.

(ඉහත ව්‍යාපෘතියට අදාලව ගිවිසුම අත්සන් කර භාර දීම)

10. ඌනභාවිත පළතුරු භාවිතා කරමින් RTS (Ready to Serve drink) පලතුරු බීම නිෂ්පාදනය කිරීම

ඌනභාවිත පළතුරු පරිභෝජනය ජනතාව අතර ප්‍රචලිත කිරීම හා අගය එකතු කළ නිෂ්පාදනයන් හඳුන්වාදීමේ අරමුණින් යුතුව නියමු ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මෙහිදි වෙරළු, අනෝදා සහ අඹ මූලිකව පලතුරු ලෙස යොදා ගන්නා අතර ගන්නොරුව ආහාර පර්යේෂණ ඒකකයේ මෙම බීම නිෂ්පාදනය කෙරේ. මේ සඳහා රු.මි 0.14ක් ජෛව විවිධත්ව ආහාර හා පෝෂණ සංවිධානය මගින් ලැබුණු අතර රු.මි 0.085ක් වියදම් කර ඇත. ආදායම ලෙස 0.034ක් උපයා ඇත.



(වෙරළු හා අනෝදා බීම සකස් කිරීම හා අවසන් නිෂ්පාදනය)

11. පාරම්පරික වී මිලදී ගැනීමේ ව්‍යාපෘතිය

නිරෝගී දිවිය හා සැමට පෝෂණීය ආහාර යන තිරසාර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම සඳහා පාරම්පරික සහල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකාව පුරා පැතිරි යන බෝ නොවන රෝග වලින් වැලකීම සඳහා මෙම සහල් පරිභෝජනය වැදගත් වේ. එහිදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාරම්පරික වී වගා කරන ගොවීන්ගෙන් වී මිලදී ගෙන කලංකුට්ටිය කර්මාන්ත ශාලාවේදී ඒවා සහල් බවට පත් කර දෙහිවල, නාරාහේන්පිට අලෙවිසැල් හා හෙල්දි ෆුඩ් ෂොප් හරහා අලෙවි කිරීම සිදු කරයි. මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම රු. මි 6.54 කි. ආදායම රු. මි 4.467ක් වන අතර ඒ අනුව වසරේ ශුද්ධ ලාභය රු. මි 0.42 ක් ලබා ඇත.

12. ගෙවතු වගාවට අත්වැලක් (මිරිස් පැළ ව්‍යාපෘතිය)

ඉඩ කඩ අඩු නාගරික ජනතාවට වගා කිරිමට අවස්ථාවක් ලබා දීම හා තමාගේ අතින් සිටුවා ගත් භෝගයක රස විදිමෙන් පවුලේ සැමට මානසික තෘප්තියක් ලබා දීමේ අරමුණින් නාගරික ජනතාවට හා මහල් නිවාස වල ජීවත් වන ජනතාවට එක නිවසකට මිරිස් පැල 6 බැගින් නිවාස 1500 කට නොමිලේ බෙදා දෙන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් රු .මි 0.618 ක මුදලක් ලබා දුන් අතර රු.මි 0.519 ක් වියදම් කර ඇත.

(මිරිස් පැළ ව්‍යාපෘතියේ විවිධ අවස්ථා)

13. වරලත් අලෙවිසැල් පිහිටුවීම (හෙල්දි ෆුඩ් ෂොප්)

වස විසෙන් තොර ගුණාත්මක බැවින් ඉහළ දේශීය ආහාර පහසුවෙන් පාරිභෝගිකයන්ට ලබා ගත හැකි අවස්ථා ඇති කිරීම මෙම ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තු වන අතර දේශීය සහල්, ධාන්‍යය වර්ග හා සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින්ගේ විවිධ නිෂ්පාදන 200කට ආසන්න ප්‍රමාණයක් මෙම අලෙවිසැල් හරහා පාරිභෝගිකයින්ට ලබා දෙයි. ලංකාව පුරාම මෙම අලෙවිසැල් 100ක් පමණ විවෘත කිරිමට යෝජිත අතර දැනට අලෙවිසැල් 09ක් විවෘත කර ඇත.

(අලෙවි සැලක් තුල නිෂ්පාදන තබා ඇති අයුරු හා බත්තර මුල්ල අලෙවි සැල විවෘත කරන අවස්ථාවක්)

14. (2016-" Sri Lankan Food Festival") ආහාර සැණකෙළිය

දිළිඳුකම පිට දැකීම යන තිරසාර සංවර්ධනය අරමුණ යටතේ 2016 වසරේ විහාර මහා දේවී උද්‍යානය අසල ඇති ග්‍රීන් පාත් හී දී "Sri Lankan Food Festival"(ආහාර සැණකෙළිය) පවත්වන ලදි. අහිතකර ආහාර වෙනුවට වස විසෙන් තොර දේශීය ආහාර භාවිතය නැවත ජනතාවට හුරු කරවීම සඳහා ලංකාවේ ඇති පළාත් 9 ම නියෝජනය වන පරිදි ඒ ඒ පළාතට ආවේනික පැරණි ආහාර වර්ග ප්‍රායෝගිකව සාදාගන්නා ආකාරය හා ඒවායේ රස බැලීමට ද අවස්ථාවක් මෙහිදි ජනතාවට උදා කර දෙන ලදි.

(ප්‍රදර්ශණය නැරඹීමට පැමිණි ජනතාවට වස විසෙන් තොර දේශීය ආහාර ලබා දීම)

එසේම වස විස නැති පාරම්පරික සහල් හා සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ජනතාවට මිලදී ගැනිමට හෙල්දි ෂොප් අලෙවි සැලක් ද මෙහිදී විවෘතව තබන ලදි. එසේම පාසල් ළමුන් මෙම ආහාර පිළිබද දැනුවත් කිරිමේ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදි.

(ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා විසින් ප්‍රදර්ශණ භූමියේ නිරීක්ෂණ කටයුතු සිදු කිරිම)

15. භාණ්ඩාගාර ප්‍රතිපාදන

	අයවැය ප්‍රතිපාදන 2015 (රු.මි.)	ලැබුන ප්‍රධානයන් (රු.මි.)	සත්‍ය වියදම (රු.මි.)	වැඩි වියදම (රු.මි)
පුනරාවර්තන	54.154	38.00	44.063	16.154
ප්‍රාග්ධන	මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලැබී නැත			
එකතුව	54.154	38.00	44.063	16.154

2016 වාර්ෂික ගිණුම් වාර්තාව

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

මෙම මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශණය සාමාන්‍ය පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සකස් කර ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, ඓතිහාසික පිරිවැය පදනම මත සහ අඛණ්ඩ පැවැත්ම පදනම මත පිහිටා සකස් කර ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති:

1. ක්ෂය ගණනය කිරීම්, වත්කම් මිලදී ගත් දිනයේ සිට සිදුකරන අතර සියළුම වත්කම් ඵලදායි ජීවිත කාලය පුරා ක්ෂය කර ඇත.

2. ලැබිය යුතු ශේෂ බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම් සිදුකර ඇත.

3. හඳුනා ගත් සියළුම වගකීම් සඳහා වෙන් කිරීම් කර ඇත.

4. පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් ගණනය කර ඇත්තේ පාරිතෝෂිත හිමි එක් එක් සේවකයන්ගේ සේවා කාලය පදනම් කර ගනිමිනි.

5. වියදම් ඉක්මවා ගිය ආදායම් ගණනය කර ඇත්තේ දන්නා සියළුම වගකීම් සඳහා වෙන් කිරීම් සිදු කල පසුවය.

6. තොග ගණනය කරනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගයට වන අතර, පහත සඳහන් තොග සඳහා පිරිවැය පහත සඳහන් ක්‍රම යටතේ ගණනය කරනු ලබයි.
   a. අමුද්‍රව්‍ය - ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට සත්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
   b. නොනිමි තොග - සෘජු අමුද්‍රව්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
   c. නිමි තොග - සෘජු අමුද්‍රව්‍ය, විචල්‍යය පොදුකාර්ය පිරිවැය සහ සෘජු වැටුප් ඇතුලත්ව සත්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
   d. පාරිභෝගික ද්‍රව්‍ය - සත්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.

7. රජයෙන් ලද ප්‍රතිපාදන ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස වෙන්කර පෙන්වා ඇති අතර වියදම් අයිතමයන්ද වෙන්කර ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

1. 2016 වර්ෂය තුලදී ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

ව්‍යාපෘතිය	අරමුදල් ලබා දුන්නේ	ව්‍යාපෘතිය පිහිටි ස්ථානය
ගොවිපල සංවර්ධනය - තණමල්විල	ස්ව අරමුදල්	තණමල්විල
ගොවිපල සංවර්ධනය - බුත්තල	ස්ව අරමුදල්	බුත්තල
පාරම්පරික සහල් ව්‍යාපෘතිය	ස්ව අරමුදල්	කළංකුට්ටිය
පැල තවාන - දෙහිවල	ස්ව අරමුදල්	දෙහිවල
පැල තවාන - ප්‍රධාන කාර්යාලය	ස්ව අරමුදල්	නාරාහේන්පිට
මිරිස් පැල ව්‍යාපෘතිය	කෘෂිකර්ම අමාත්‍යාංශය	කොළඹ
නාගරික ගෙවත්ත සංවර්ධනය	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	නාරාහේන්පිට
සහල් බලකරන ව්‍යාපෘතිය	ලෝක ආහාර වැඩසටහන	කළංකුට්ටිය
ඌන භාවිත පළතුරු වලින් පළතුරු බීම නිෂ්පාදනය	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	ගන්නොරුව
ගොවි සතිය	කෘෂිකර්ම අමාත්‍යාංශය	ග්‍රීන් පාත්
හෙල්දිව් ඵුඩ් අලෙවිසැල් සහ හෙල්දිව් ඵුඩ් බසාර්	ස්ව අරමුදල්	කොළඹ
බඩ ඉරිගු ව්‍යාපෘතිය	ගොවි භාරකාර අරමුදල	කළංකුට්ටිය
සහල් පිටි ව්‍යාපෘතිය	ස්ව අරමුදල්	කළංකුට්ටිය
සෝයා ව්‍යාපෘතිය	ගොවි භාරකාර අරමුදල	උඩුල්දෙනිය
සුවපෝෂ පෝෂණ පැකට්ටුව	ස්ව අරමුදල්	ගන්නොරුව
මව්පෝෂ පෝෂණ පැකට්ටුව	ස්ව අරමුදල්	ගන්නොරුව
කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම	ස්ව අරමුදල්	බුත්තල
ගොවි නිෂ්පාදන අලෙවි සැල-දෙහිවල	ස්ව අරමුදල්	දෙහිවල
හෙල්දිව් ඵුඩ් භෝජනාගාරය	ස්ව අරමුදල්	නාරාහේන්පිට

2. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය යටතේ පහත සඳහන් ජංගම ගිණුම් මෙම වසරේදී පවත්වා ගෙන යන ලදී.

194125 - භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන.
කෘෂිකර්ම අමාත්‍යාංශය, ලෝක ආහාර වැඩසටහන සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලැබෙන ප්‍රතිපාදන.
ගොවිපල සංවර්ධනය - බුත්තල, ගොවිපල සංවර්ධනය - තණමල්විල, අම්බලන්තොට ගොවිපල සංවර්ධනය, සුවපෝෂ ව්‍යාපෘතිය, මව්පෝෂ ව්‍යාපෘතිය, වතුකරයේ සහල් පිටි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, පැල තවාන, දෙහිවල අලෙවි සැල, හෙල්දි ෆුඩ් භෝජනාගාරය, කොම්පෝස්ට් ව්‍යාපෘතිය.

337100196138295 - දෙහිවල අලෙවිසැලේ ආදායම

78641885 - හෙල්දි ෆුඩ් බසාර්

3. සෑම ව්‍යාපෘතියක් සඳහාම වෙන වෙනම ලෙජර් පවත්වා ගෙනු යනු ලබයි.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

2016 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

විස්තරය	සටහන	2016 රු.	2015 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	1	***337,395,749.18***	***342,006,088.38***
ඉඩම්		307,200,000.00	307,200,000.00
ගොඩනැගිලි		16,078,696.90	16,373,609.27
මෝටර් වාහන		3,900,000.00	5,875,000.00
යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර සූත්‍ර		1,587,339.79	2,177,383.41
ලි බඩු සහ සවිකිරීම්		992,168.92	1,346,928.26
කාර්යාල උපකරණ		1,690,775.58	1,962,203.81
කෘෂිකාර්මික උපකරණ		281,000.00	443,000.00
උද්‍යාන උපකරණ		331,302.03	200,000.00
වෙනත් උපකරණ		1,675,256.08	2,146,815,.37
පරිගණක උපාංග		725,195.01	1,084,277.38
තාවකාලික ගොඩනැගිලි		2,015,988.21	2,127,987.55
මිනුම් උපකරණ		69,626.66	100,183.33
අස්පෘශ්‍ය වත්කම්			
මෘදුකාංග		848,400.00	968,700.00
මූල්‍ය වත්කම්		***806,118.84***	***855,088.71***
ඉතුරුම් තැන්පතු		806,118.84	774,478.21
ණය		-	80,610.50
ජංගම වත්කම්		***28,230,216.97***	***8,064,308.68***
තැන්පතු		201,816.50	201,816.50
තොගය		16,262,291.19	4,874,033.32
ණය ගැතියෝ		938,993.77	979,476.77
අත්තිකාරම්		-	21,900.00
ලැබිය යුතු මුදල්		10,606,619.17	317,900.51
අතැති සහ බැංකු මුදල්		220,496.34	1,669,181.58
මුළු වත්කම්		**366,432,084.99**	**350,925,485.77**
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත		***333,666,727.38***	***334,367,991.14***
අරමුදල් ශේෂය		374,870,896.72	375,001,390.22
ඒකාබද්ධ අරමුදල		(41,204,169.34)	(40,633,399.08)
ජංගම නොවන වගකීම්		***13,775,284.82***	***10,245,455.80***
විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම		3,875,284.82	4,845,455.80
මධ්‍ය කාලීන ණය		9,900,000.00	5,400,000.00
ජංගම වගකීම්		***18,990,072.79***	***6,312,038.83***
කෙටි කාලීන ණය		-	187,500.06
රඳවාගත් මුදල්		145,701.45	668,747.75
ආපසු ගෙවිය යුතු තැන්පතු		1,073,000.00	-
උපචිත වියදම්		17,771,371.34	5,455,791.02
මුළු හිමිකම් හා වගකීම්		**366,432,084.99**	**350,925,485.77**

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

2016 දෙසැම්බර් 31 වන දිනට මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

විස්තරය	සටහන්	රු. 2016	රු. 2015
ආදායම්		**73,426,388.30**	**41,753,482.54**
භාණ්ඩාගාර/අමාත්‍යාංශ ප්‍රදාන		61,112,012.18	38,720,477.23
වෙනත් මෙහෙයුම් ආදායම්	2	11,525,055.49	2,507,011.58
ඉතිරි කිරීම් ගිණුම්වල පොලිය		31,640.63	28,103.73
වත්කම් ඉවත් කිරීමෙන් ලද මුදල		2,314,950.00	1,773,392.00
වත්කම් විකුණුම් මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම		(2,508,700.00)	(1,771,892.00)
වෙනත් ආදායම්		951,430.00	496,390.00
වියදම්		**75,769,730.36**	**55,678,542.06**
පුද්ගල වේතන		33,912,586.68	36,004,207.89
ගමන් වියදම්		681,562.05	148,900.95
සැපයුම් සහ අවශ්‍යතා		5,339,316.35	1,257,729.96
ස්ථාවර වත්කම් අළුත්වැඩියාව සහ නඩත්තුව		4,272,608.03	4,312,188.80
පරිවර්තන, සන්නිවේදන, උපයුක්ත සහ වෙනත් සේවාවන්		31,563,657.25	13,955,514.46
වියදම ඉක්මවූ ආදායම / අතිරික්තය (ඌනතාවය)		**(2,343,342.06)**	**(13,925,059.52)**

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2016 රු.	2015 රු.
මෙහෙයුම් ක්‍රියාවන් මගින් (භාවිතා කරන) / ලැබෙන මුදල් ප්‍රවාහය			
ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය/අලාභය		(2,343,342.06)	(13,925,059.52)
ගැලපුම්			
ක්ෂය කිරීම්	1	5,449,799.62	7,018,714.21
වාහන ඉවත් කිරීම්/මාරු කිරීම් ක්ෂය		(1,006,250.00)	(1,658,500.00)
දේපල, පිරියත සහ උපකරණ ඉවත් කිරීම්/මාරු කිරීම්		1,200,000.00	1,658,500.00
ගොවීන්ගේ ණය කපා හැරීම්		80,610.50	-
ආයෝජන ක්‍රියාකාරකම් මගින් ඉපැයූ පොලී ආදායම		(31,640.63)	(28,103.73)
පෙර කාල පරිච්ඡේදයේ ගැලපුම්		1,642,078.30	37,387.00
විශ්‍රාමික පාරිතෝෂිත සඳහා වෙන් කිරීම්		(970,170.98)	1,918,762.60
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය		**4,021,084.75**	**(4,978,299.44)**
තොගය (වැඩිවීම්) / අඩුවීම්		(11,388,257.87)	4,735,519.16
වෙළඳ සහ වෙනත් ලැබීම් (වැඩිවීම්) / අඩුවීම්		(10,226,335.66)	295,367.80
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ වල වැඩි කිරීම්/අඩු කිරීම්		12,865,534.02	(638,209.35)
මෙහෙයුම් මගින් ජනනය වූ මුදල්		(8,749,059.51)	4,392,677.61
මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ලද ශුද්ධ මුදල්		**(4,727,974.76)**	**(585,621.83)**
ආයෝජන ක්‍රියාකාරකම් මගින් ලැබුණු / (භාවිතා කල) මුදල් ප්‍රවාහය			
දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම්	1	(1,033,210.42)	(5,527,463.03)
දේපල, පිරියත සහ උපකරණ ඉවත් කිරීම්/මාරු කිරීම්		2,508,700.00	-
වාහන විකුණුම් ආදායම මහා භාණ්ඩාගාරයට ගෙවීම		(2,508,700.00)	-
ආයෝජන ක්‍රියාකාරකම් / (භාවිතා කල) මගින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(1,033,210.42)**	**(5,527,463.03)**
මූල්‍ය ක්‍රියාකාරකම් මගින් ලද / (භාවිතා කල) මුදල් ප්‍රවාහය			
අරමුදල් ලැබීම්		61,112,012.18	43,720,477.23
ආධාර මුදල්		(61,112,012.18)	(38,720,477.23)
ණය ලැබීම්		20,000,000.00	3,000,000.00
ණය නැවත ගෙවීම්		(15,687,500.06)	(287,499.97)
		4,312,499.94	**7,712,500.03**
මුදල් සහ මුදල් වලට සමාන දේ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		(1,448,685.24)	1,599,415.17
වර්ෂය මුලදී තිබූ මුදල් සහ මුදල් වලට සමාන දේ		1,669,181.58	69,766.41
වර්ෂය අවසානයේදී තිබූ මුදල් සහ මුදල් වලට සමාන දේ		**220,496.34**	**1,669,181.58**
සටහන - A			
බැංකු ශේෂය		1,669,181.58	69,766.41
අත ඉතිරි මුදල්		-	-
		1,669,181.58	**69,766.41**

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
2016 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රත්‍යාගණන අරමුදල රු.	අරමුදල් ශේෂය රු.	ඒකාබද්ධ අරමුදල රු.	එකතුව රු.
01.01.2016 දිනට ශේෂය	328,671,316.14	46,330,074.08	(40,633,399.08)	334,367,991.14
ලැබුණු අරමුදල්		61,112,012.18		61,112,012.18
ආධාර මුදල්		(61,112,012.18)		(61,112,012.18)
පෙර කාලච්ඡේද ගැලපීම්		(130,493.50)	1,772,571.80	1,642,078.30
ඌන වෙන් කිරීම්		-	-	-
ශුද්ධ අතිරික්තය/(ඌනතාව)			(2,343,342.06)	(2,343,342.06
	328,671,316.14	**46,199,580.58**	**(41,204,169.34)**	**333,666,727.38**

සටහන 01
ජංගම නොවන වත්කම්

වත්කම් වර්ගය	ඉඩම් සහ ගොඩනැගිලි	මෝටර් වාහන	යන්ත්‍රෝපකරණ සහ උපකරණ	කාර්යාලිය උපකරණ	ලි බඩු සහ සවිකිරීම්	කෘෂි උපකරණ	උද්‍යාන උපකරණ	වෙනත් උපකරණ	ඡායාරූප සහ සිනමා උපකරණ	තාවකාලික ගොඩනැගිලි	මැනිම් උපකරණ	පරිගණක උපකරණ	මෘදුකාංග	එකතුව
2016.01.01 ට ශේෂය	**323,573,609.27**	**5,875,000.00**	**2,177,383.41**	**1,962,203.81**	**1,346,928.26**	**443,000.00**	**200,000.00**	**2,146,815.37**	**-**	**2,127,987.55**	**100,183.33**	**1,084,277.38**	**968,700.00**	**342,006,088.38**
එකතු කිරීම්	590,970.42	-	-	149,850.00	4,500.00	-	197,990.00	-	-	-	-	89,900.00	-	1,033,210.42
ඉවත් කිරීම් / මාරු කිරීම්(ස්ථාවර වත්කම්)	-	(1,200,000.00)	-	-	-	-	-	-	-	-	-	-	-	(1,200,000.00)
ඉවත් කිරීම් / මාරු කිරීම්(සමුච්චිත ක්ෂය කර ඇති අගයන්)	-	1,006,250.00	-	-	-	-	-	-	-	-	-	-	-	1,006,250.00
වර්ෂය සඳහා ක්ෂය වීම්	(885,882.79)	(1,781,250.00)	(590,043.62)	(421,278.23)	(359,259.34)	(162,000.00)	(66,687.97)	(471,559.29)	-	(111,999.34)	(30,556.67)	(448,982.37)	(120,300.00)	(5,449,799.62)
ශුද්ධ ප්‍රත්‍යාගණනය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
2016.12.31 දිනට ශුද්ධ අගය	323,278,696.90	3,900,000.00	1,587,339.79	1,690,775.58	992,168.92	281,000.00	331,302.03	1,675,256.08	-	2,015,988.21	69,626.66	725,195.01	848,400.00	337,395,749.18
ප්‍රත්‍යාගණන අතිරික්තයේ එකතුව	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ප්‍රත්‍යාගණන ඌණතාවයේ එකතුව	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
දළ ධාරණ වටිනාකම	325,110,328.42	6,500,000.00	2,888,780.00	2,506,071.78	1,683,846.75	639,500.00	397,990.00	2,613,350.00	3,540.00	2,239,986.89	130,740.00	1,676,160.00	1,089,000.00	347,479,293.84
සමුච්චිත ක්ෂයවීම්	(1,831,631.51)	(2,600,000.00)	(1,301,440.21)	(815,296.20)	(691,677.83)	(358,500.00)	(66,687.97)	(938,093.92)	(3,540.00)	(223,998.68)	(61,113.34)	(950,964.99)	(240,600.00)	(10,083,544.65)
ශුද්ධ ධාරණ වටිනාකම	**323,278,696.90**	**3,900,000.00**	**1,587,339.79**	**1,690,775.58**	**992,168.92**	**281,000.00**	**331,302.03**	**1,675,256.08**	**-**	**2,015,988.21**	**69,626.66**	**725,195.01**	**848,400.00**	**337,395,749.18**

සටහන 02 :වෙළඳ හා ලාභ අලාභ ගිණුම්

2.1 **දෙහිවල අලෙවි සැල**

2016.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2016 රු.	2015 රු.
වෙළඳ ආදායම	**42,421,955.67**	**44,427,486.94**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	1,574,895.14	1,481,735.70
මිලදී ගැනිම්	35,564,265.13	36,489,702.80
ප්‍රවාහන	64,422.00	62,060.00
අවසාන තොගය	(1,971,127.64)	(1,574,895.14)
	35,232,454.63	36,458,603.36
දළ ලාභය/අලාභය	**7,189,501.04**	**7,968,883.58**
පොදු කාර්ය පිරිවැය	6,944,136.70	6,519,382.34
ශුද්ධ ලාභය/අලාභය	**245,364.34**	**1,449,501.24**

2.2 **පැල තවාන ප්‍රධාන කාර්යාලය**

2016.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2016 රු.	2015 රු.
වෙළඳ ආදායම	**9,504,277.40**	**7,828,601.61**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	1,059,868.78	456,182.00
මිලදී ගැනිම්	5,885,065.35	5,073,167.50
අවසාන තොගය	(717,087.84)	(1,059,868.78)
	6,227,846.29	4,469,480.72
දළ ලාභය/අලාභය	**3,276,431.11**	**3,359,120.89**
පොදු කාර්ය පිරිවැය	1,810,963.94	2,012,214.42
ශුද්ධ ලාභය/අලාභය	**1,465,467.17**	**1,346,906.47**

2.3 පැල තවාන දෙහිවල

2016.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2016 රු.	2015 රු.
වෙළඳ ආදායම	**4,275,431.00**	**3,417,684.50**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	126,271.80	351,247.72
මිලදී ගැනීම්	2,872,271.00	2,426,249.00
තොග හානි	-	-
අවසාන තොගය	(956,813.78)	(126,271.80)
	2,041,729.02	2,651,224.92
දළ ලාභය/අලාභය	**2,233,701.98**	**766,459.58**
පොදු කාර්ය පිරිවැය	924,270.40	906,810.10
ශුද්ධ ලාභය/අලාභය	**1,309,431.58**	**(140,350.52)**

2.4 වතුකරයේ සහල් පිටි භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය - කලංකුට්ටිය

2016.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන, වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතමය	2016 රු.	2015 රු.
ආරම්භක තොගය	442,681.10	3,352,991.90
මිලදී ගැනීම්	1,237,135.00	454,560.73
තොග හානි	(18,525.00)	(3,546.00)
අවසන් තොගය - ද්‍රව්‍ය	-	(442,681.10)
අමුද්‍රව්‍ය සඳහා වියදම	1,661,291.10	3,361,325.53
සෘජු වැටුප්	-	-
ප්‍රවාහන වියදම්	-	-
ආරම්භ තොගය - නොනිමි වැඩ	-	-
තොග හානි	(124,440.00)	-
අවසන් තොගය - නොනිමි වැඩ	-	-
නිෂ්පාදන වියදම්	1,536,851.10	3,361,325.53

විකුණුම් ආදායම	**1,412,650.32**	**665,226.03**
අඩු කලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	33,724.50	67,400.00
නිෂ්පාදන වියදම්	1,536,851.10	3,361,325.53
	1,570,575.60	3,428,725.53
තොග හානි	(42,900.00)	-
අවසන් තොගය	(27,329.80)	(33,724.50)
	1,500,345.80	3,395,001.03
දළ ලාභය/අලාභය	**(87,695.48)**	**(2,729,775.00)**
පොදු කාර්ය පිරිවැය	**2,138,698.64**	**2,540,635.19**
ශුද්ධ ලාභය/අලාභය	**(2,226,394.12)**	**(5,270,410.19)**

2.5 **සුවපෝෂ නිෂ්පාදන කර්මාන්ත ශාලාව - ගන්නෝරුව**

2016.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන වෙළඳ ලාභ අලාභ ගිණුම

අයිතමය	**2016** රු.	**2015** රු.
ආරම්භක තොග	140,000.00	999,592.55
මිලදී ගැනීම්	337,756.00	132,516.72
තොග හානි	(130,000.00)	
අවසන් තොග - අමු ද්‍රව්‍ය	-	(140,000.00)
අමුද්‍රව්‍ය සඳහා වියදම	347,756.00	992,109.27
සෘජු වැටුප්	-	-
ආරම්භක තොග - නොනිම් වැඩ	-	-
අවසන් තොග - නොනිම් වැඩ	-	-
නිෂ්පාදන පිරිවැය	347,756.00	992,109.27
විකුණුම් ආදායම	**261,036.60**	**255,544.00**
අඩු කලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග	10,000.00	155,950.00
නිෂ්පාදන පිරිවැය	347,756.00	992,109.27
	357,756.00	1,148,059.27

අවසන් තොගය	(233.25)	(10,000.00)
	357,522.75	1,138,059.27
දළ ලාභය/අලාභය	**(96,486.15)**	**(882,515.27)**
පොදු කාර්ය පිරිවැය	642,622.40	219,654.70
ශුද්ධ ලාභය/අලාභය	**(739,108.55)**	**(1,102,169.97)**

2.6 **හෙල්දිදි ඵුඩ් භොජනාගාරය**

2016.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ ලාභ අලාභ ගිණුම

අයිතම	**2016 රු.**	**2015 රු.**
විකුණුම් ආදායම	**11,015,509.64**	**14,936,207.64**
අඩුකලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	237,898.50	212,587.15
මිලදී ගැනීම්	9,298,610.39	12,068,008.05
වැටුප්	4,367,587.34	6,216,845.79
අවසන් තොග	(44,718.50)	(237,898.50)
	13,859,377.73	18,259,542.49
දළ ලාභය/අලාභය	**(2,843,868.09)**	**(3,323,334.85)**
පොදු කාර්ය පිරිවැය	968,647.85	869,198.24
ශුද්ධ ලාභය/අලාභය	**(3,812,515.94)**	**(4,192,533.09)**

2.7 **මව්පෝෂ ව්‍යාපෘතිය**

2016.12.31න් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන වෙළඳ, ලාභ සහ අලාභ ගිණුම

අයිතම	2016 රු.	2015 රු.
ආරම්භක තොග	482,774.50	1,681,715.46
මිළදී ගැනීම්	396,250.00	1,350,865.10
ප්‍රවාහන	26,300.00	-
තොග හානි	(265,000.00)	-
අවසන් තොග - අමු ද්‍රව්‍ය	(6,555.00)	(482,774.50)
	633,769.50	2,549,806.06
නිෂ්පාදන පිරිවැය	633,769.50	2,549,806.06
විකුණුම් ආදායම	**773,995.35**	**347,307.50**
අඩු කලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග	295,460.00	671,040.00
නිෂ්පාදන පිරිවැය	633,769.50	2,549,806.06
	929,229.50	3,220,846.06
තොග හානි	(67,797.62)	
අවසන් තොගය	(596.46)	(295,460.00)
	860,835.42	2,925,386.06
දළ ලාභය/අලාභය	**(86,840.07)**	**(2,578,078.56)**
පොදු කාර්ය පිරිවැය	1,570,957.20	3,862,981.49
ශුද්ධ ලාභය/අලාභය	**(1,657,797.27)**	**(6,441,060.05)**

2.8 **බුත්තල කොම්පෝස්ට් ව්‍යාපෘතිය**

2016.12.31න් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන වෙළඳ, ලාභ සහ අලාභ ගිණුම

අයිතම	2016 රු.	2015 රු.
ආරම්භක තොග	-	136,460.00
වගා කිරීමේ පිරිවැය	946,553.60	43,879.00
සෘජු වැටුප්	-	109,568.40
ප්‍රවාහන	-	-
අවසන් තොග - අමු ද්‍රව්‍ය	(234,349.80)	-
	712,203.80	289,907.40
ආරම්භක තොග - නොනිමි වැඩ	-	-
අවසන් තොග - නොනිමි වැඩ	-	-
නිෂ්පාදන පිරිවැය	712,203.80	289,907.40
විකුණුම් ආදායම	**916,206.25**	**272,885.00**
අඩු කලා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග	-	42,650.00
නිෂ්පාදන පිරිවැය	712,203.80	289,907.40
අවසන් තොගය	-	-
	712,203.80	**332,557.40**
දළ ලාභය / අලාභය	**204,002.45**	**(59,672.40)**
පොදු කාර්ය පිරිවැය	**147,408.90**	**79,201.33**
ශුද්ධ ලාභය	**56,593.55**	**(138,873.73)**

2.9 පාරම්පරික සහල් ව්‍යාපෘතිය

2016.12.31න් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන වෙළඳ, ලාභ සහ අලාභ ගිණුම

අයිතම	2016 රු.	2015 රු.
ආරම්භක තොග	313,509.90	-
මිළදී ගැනිම්	5,559,276.40	988,703.09
ප්‍රවාහන	33,915.00	-
ඇඹරීමේ වියදම්	124,380.00	-
ඍජු වැටුප්	659,448.00	-
තොග හානි	(732,375.00)	-
අවසාන තොගය	(122,520.00)	(313,509.00)
	5,835633.40	675,194.09
ආරම්භක තොග - නොනිමි වැඩ	**-**	**-**
තොග හානි	(1,013,841.00)	-
අවසන් තොග - නොනිමි වැඩ	**-**	**-**
නිෂ්පාදන පිරිවැය	4,821,792.40	675,194.09
විකුණුම් ආදායම	**4,467,445.00**	**105,710.00**
<u>අඩු කලා: විකුණුම් පිරිවැය</u>		
ආරම්භක තොග	156,950.00	-
නිෂ්පාදන පිරිවැය	4,821,792.40	675,194.09
	4,978,742.40	675,194.09
තොග හානි	(1,029,860.00)	
අවසන් තොගය	(67,940.00)	(156,950.00)
	3,880,942.40	**518,244.09**
දළ ලාභය / අලාභය	**586,502.60**	**(412,534.09)**
පොදු කාර්ය පිරිවැය	**167,822.40**	**1,075,732.36**
ශුද්ධ ලාභය	**418,680.20**	**(1,488,266.45)**

2.10 බුත්තල ගොවිපල

2016.12.31න් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන වෙළඳ, ලාභ සහ අලාභ ගිණුම

අයිතම	2016 රු.	2015 රු.
ආරම්භක තොග	-	-
වගා කිරීමේ පිරිවැය	3,575.00	46,338.80
සෘජු වැටුප්	- -	-
අවසන් තොග - අමු ද්‍රව්‍ය	-	-
	3,575.00	46,338.80
ආරම්භක තොග - නොනිමි වැඩ	-	-
අවසන් තොග - නොනිමි වැඩ	-	-
නිෂ්පාදන පිරිවැය	3,575.00	46,338.80
විකුණුම් ආදායම	**4,000.00**	**190,656.50**
අඩු කළා: විකුණුම් පිරිවැය		
ආරම්භක තොග		
නිෂ්පාදන පිරිවැය	3,575.00	46,338.80
අවසන් තොගය	-	-
	3,575.00	46,338.80
දළ ලාභය / අලාභය	**425.00**	**144,317.70**
පොදු කාර්ය පිරිවැය	542,637.75	1,161,944.24
ශුද්ධ ලාභය/අලාභය	**(542,212.75)**	**(1,017,626.54)**

2.11 තණමල්විල ගොවිපල

2016.12.31න් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන වෙළඳ, ලාභ සහ අලාභ ගිණුම

අයිතම	2016 රු.	2015 රු.
ආරම්භක තොග	-	-
වගා කිරීමේ පිරිවැය	- -	48,120.00
අවසන් තොග - අමු ද්‍රව්‍ය	-	-
	-	48,120.00
ආරම්භක තොග - නොනිමි වැඩ	-	-
අවසන් තොග - නොනිමි වැඩ	-	-

නිෂ්පාදන පිරිවැය		48,120.00
විකුණුම් ආදායම	**128,000.00**	**302,260.00**
අඩු කලා: විකුණුම් පිරිවැය	**-**	**-**
ආරම්භක තොග		
නිෂ්පාදන පිරිවැය	-	48,120.00
අවසන් තොගය	-	-
	-	48,120.00
දළ ලාභය / අලාභය	**128,000.00**	**254,140.00**
පොදු කාර්ය පිරිවැය	655,412.52	869,010.37
ශුද්ධ ලාභය/අලාභය	**(527,412.52)**	**(614,870.37)**

2.12 සෝයා ව්‍යාපෘතිය

2016.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2016 රු.
වෙළඳ ආදායම	**-**
අඩුකලා: විකුණුම් පිරිවැය	
ආරම්භක තොගය	-
මිලදී ගැනිම්	8,574,519.50
ඇසුරුම් වියදම	72,756.68
ඇඹරීමේ වියදම	90,258.10
ගබඩා කිරීමේ වියදම	55,140.00
අවසාන තොගය	(8,631,729.50)
	160,944.78
දළ ලාභය/අලාභය	**(160,944.78)**

2.13 **බඩඉරිගු ව්‍යාපෘතිය**

2016.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2016 රු.
වෙළඳ ආදායම	**16,137,660.00**
අඩුකලා: විකුණුම් පිරිවැය	
ආරම්භක තොගය	-
මිලදී ගැනීම්	15,189,871.25
ඇසුරුම් වියදම්	132,812.50
ප්‍රවාහන වියදම්	115,000.00
තොග හානි	(56,551.00)
අවසාන තොගය	-
	15,381,132.75
දළ ලාභය/අලාභය	**756,527.25**
පොදු කාර්ය පිරිවැය	638,345.69
ශුද්ධ ලාභය/අලාභය	**118,181.56**

2.14 **මුං ඇට ව්‍යාපෘතිය**

2016.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	2016 රු.
වෙළඳ ආදායම	**1,483,475.00**
අඩුකලා: විකුණුම් පිරිවැය	
ආරම්භක තොගය	-
මිලදී ගැනීම්	1,207,800.00
ඇසුරුම් වියදම්	-
ප්‍රවාහන වියදම්	-
තොග හානි	-
අවසාන තොගය	-
	1,207,800.00
දළ ලාභය/අලාභය	**275,675.00**

2.15 **හෙල්දිඵුඩ් බසාර් ව්‍යාපෘතිය**

2016.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

අයිතම	**2016 රු.**
වෙළඳ ආදායම	**3,274,892.13**
අඩුකලා: විකුණුම් පිරිවැය	
ආරම්භක තොගය	-
මිලදී ගැනිම්	3,124,768.50
ඇසුරුම් වියදම්	-
අවසාන තොගය	-
	3,124,768.50
දළ ලාභය/අලාභය	**150,123.63**
පොදු කාර්ය පිරිවැය	14,810.00
ශුද්ධ ලාභය/අලාභය	**135,313.63**

වෙළඳ හා ලාභ අලාභ ගිණුම්	**2016 රු.**	**2015 රු.**
දෙහිවල අලෙවි සැල	7,189,501.04	7,968,883.58
නාරාහේන්පිට පැල තවාන	3,276,431.11	3,359,120.89
දෙහිවල පැල තවාන	2,233,701.98	766,459.58
කලංකුට්ටිය සහල් පිටි ව්‍යාපෘතිය	(87,695.48)	(2,729,775.00)
සුවපෝෂ ව්‍යාපෘතිය	(96,486.15)	(882,515.27)
හෙල්දිඵුඩ් භෝජනාගාරය	(2,843,868.09)	(3,323,334.85)
මව්පෝෂ ව්‍යාපෘතිය	(86,840.07)	(2,578,078.56)
බුත්තල කොම්පෝස්ට්	204,002.45	(59,672.40)
පාරම්පරික සහල් ව්‍යාපෘතිය	586,502.60	(412,534.09)
බුත්තල ගොවිපල	425.00	144,317.70
තණමල්විල ගොවිපල	128,000.00	254,140.00
සෝයා ව්‍යාපෘතිය	(160,944.78)	-
බඩඉරිගු ව්‍යාපෘතිය	756,527.25	-
මුං ඇට ව්‍යාපෘතිය	275,675.00	-
හෙල්දිඵුඩ් බසාර්	150,123.63	-
එකතුව	**11,525,055.49**	**2,507,011.58**

03. සෘජු සංවර්ධන වියදම් ආධාර මුදල් යටතේ දක්වා ඇත.

04. ප්‍රධාන කාර්යාලයේ පරිපාලනය සඳහා දැරූ සියළුම වියදම් භාණ්ඩාගාර අරමුදල් යටතේ දක්වා ඇත.

05. භාණ්ඩාගාර අරමුදල්

විස්තරය	අයවැය වෙන් කිරීම 2016	2016 සත්‍ය වියදම්	2016 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන	ඉතිරිය/ ඌනතාවය
පුනරාවර්තන	54,154,100.00	44,063,624.61	38,000,000.00	16,154,100.00
ප්‍රාග්ධන	-	-	-	-
			38,000,000.00	

06. කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ව්‍යාපෘති සඳහා ලැබුණු අරමුදල් පහත සඳහන් පරිදි පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ලෙස භාවිතා කරන ලදී.

විස්තරය	ප්‍රාග්ධන	පුනරාවර්තන	එකතුව
ව්‍යාපෘති	-	23,112,012.18	23,112,012.18
			23,112,012.18

07. අම්බලන්තොට ගොවිපලේ ඉදිකරන ලද වැට සඳහා ගෙවීමට නියමිත රු. 3,209,728.53 ක මුදල සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DMR 02401-13 යටතේ මේ වන විටත් විභාග වෙමින් පවතී.

විගණන වාර්තාව
2016

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ඒජීඑල්/එච්සීබී/01/16/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2017 මැයි 31 දින

සභාපති,

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

2

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 86 (ඇ) ඡේදය ප්‍රකාරව ගොඩනැගිලි හා වාහන ක්ෂය කිරීම සඳහා භාවිතා කළ ක්ෂය අනුපාතිකයන් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09

ප්‍රමිතයේ 09 ඡේදයට පටහැනි ලෙස පිරිවැය රු.3,481,290 ක් වූ හානි වූ තොග මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගයට ඇතුලත් කර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂය තුළ මුදල් ගලාඒම සහ මුදල් ගලායාම පිළිබිඹු වන පරිදි ක්‍රියාකාරකම් හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණ අතර, ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පහත අඩුපාඩු පැවතුණි.

(i) මෙහෙයුම් ලාභය ගණනය කිරීම සඳහා ගැලපුම් කිරීමේදී සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය රු.371,989 කින් අඩුවෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.569,140 ක් වූ පාරිතෝෂික ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

4

(ii) සමාලෝචිත වර්ෂයේ රු.31,641 ක් වූ ඉතුරුම් පොළිය නැවත ආයෝජනය කිරීම ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබුණි.

(iii) ඉකුත් වර්ෂ වලට අදාල ගොවි ණය කපා හැරීම් රු.80,610 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දෙවරක් සටහන් කර තිබුණි.

(ආ) ප්‍රත්‍යාගණන වාර්තාව අනුව තාවකාලික ගොඩනැගිලි වල ඵලදායී ජීවිත කාලය වර්ෂ10 ක් ලෙස දක්වා තිබුණු අතර ක්ෂය කිරීමේ දී වර්ෂ 19 ක් ලෙස සලකා ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ක්ෂය ප්‍රමාණය රු. 100,799 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගය රු.1,938,769 කින් වැඩියෙන් දක්වා තිබුණි.

2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හිටපු නිලධාරියෙකු විසින් 2011 වර්ෂයේදී ණය පදනම මත රු. 64,500 ක් වටිනා සුවපෝෂ හා මව්පෝෂ පැකට් ලබා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලයට ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම් වල රු. 3,300,000 ක් දක්වා තිබුණද වී අලෙවි මණ්ඩලයේ ගිණුම් අනුව එවැනි ලැබිය යුතු මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) 2011, 2012 හා 2013 වර්ෂවල සිට පැවත එන ණයගැති ශේෂවල එකතුව රු. 878,842 ක් වූ අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂ 2 ත් 5 ත් අතර කාලයක සිට පැවත එන ණයහිමි ශේෂවල එකතුව රු. 390,560 ක් හා වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට පැවත එන ණයහිමි ශේෂවල එකතුව රු. 199,757 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් ගොවිහාර අරමුදලින් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අවස්ථා 3 කදී ලබා ගන්නා ලද රු. 5,500,000 ක් වූ ණය මුදල 2016 වර්ෂය තුල ගෙවා අවසන් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු.4,900,000 ක් ගෙවිය යුතුව පැවතුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(අ) මුදල් රෙගුලාසි 177 (1) හා 371	එකතු කරගන්නා මුදල් දිනපතා බැංකු ගත කළ යුතු වුවද දෙහිවල අලෙවි සැලෙහි හා නාරාහේන්පිට පැළ තවානේ එකතු කරගත් මුදල් දින 6 ත් 12 ත් අතර කාලයක් ප්‍රමාද වී බැංකු ගත කළ අවස්ථා නිරීක්ෂණය විය. තවද දෙහිවල අලෙවි සැලේ අනුමත සුළු මුදල් අග්‍රිමය රු.70,000 ක් වුවද එම මුදල ඉක්මවා රු.131,092 සිට රු. 271,946 ක් අතර මුදලක් අත රඳවා ගෙන තිබුණි.
(ආ) මුදල් රෙගුලාසි අංක 751(1)	දෙහිවල අලෙවි සැල බඩු ලේඛන හා තොග පොත් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු 2,343,342 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 13,925,060 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,581,718 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා සහ වෙනත් සේවා වියදම රු.17,608,143 කින් වැඩි වුවද භාණ්ඩාගාරයෙන් හා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන රු.22,391,535 කින් වැඩිවීම හා අනෙකුත් ආදායම් රු.9,018,043 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී මූල්‍ය ප්‍රතිඵලයේ 2014 වර්ෂයේ අතිරික්තයක් හා 2012, 2013, 2015 හා 2016 වර්ෂවල ඌනතාවයන්ද පැවතුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේ දී 2012 වර්ෂයේ දී රු.17,768,473 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේ දී රු. 37,019,044 ක් විය.

3.2 මණ්ඩලයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියකින් තොරව මණ්ඩලයට නීත්‍යානුකූල අයිතියක් නොමැති ඉඩමක 2012 වර්ෂයේදී වැටක් ඉදිකිරීම සඳහා ගිවිසගත් වටිනාකමකින් තොරව හා ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබූ අතර කොන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීම හේතුවෙන් රු. 3,209,728 ක වන්දි මුදලක් ඉල්ලා ඔහු විසින් පැවරූ නඩුව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් වී නොතිබුණි.

3.3 වෙනත් රාජ්‍ය ආයතනවල සම්පත් උපයෝජනය කිරීම

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහන 03 ක් ද, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අයත් ට්‍රැක්ටර් 03 ක් ද, මහවැලි අධිකාරියට අයත් වාහනයක් ද, සුළු අපනයන භෝග ප්‍රවර්ධන මණ්ඩලයට අයත් වාහනයක්ද මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු නොකර උපයෝජනය කරන බව නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනත ප්‍රකාරව, සමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා ආණ්ඩුවේ නොවූ විදේශීය හා දේශීය නියෝජ්‍යාත්වවල ආධාර ලබා ගැනීම, සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම, කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනයට යොමු වූ යෝජනා ක්‍රමවලට ආධාර කිරීම, දියුණු කිරීම හා සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යාත්ව උනන්දු කිරීම, ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාර වෙනත් සමාන පිටරට ආයතන සමග සහයෝගී වීම මණ්ඩලයේ අරමුණු වේ.

(අ) යථෝක්ත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.මිලියන 617.91 ක් වැය කර ව්‍යාපෘති 12 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ එම ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ අරමුදල්වලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති 12කින් සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 274 ක ඉපයීමක් අපේක්ෂා කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුල දී උපයා ඇති ආදායම රු.මිලියන 75 ක් පමණක් විය. ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල කාර්යසාධනය පහත පරිදි විය.

(i) <u>තණමල්විල ගොවිපොළ</u>
අක්කර 16 කින් සමන්විත වූ මෙම ගොවිපොල තුල කිසිදු වගා කටයුත්තක් සිදුකර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී බදු කුලී ආදායම වශයෙන් රු.128,000 ක් උපයාගෙන තිබූ අතර මුළු වියදම රු. 655,412 ක් විය.

(ii) <u>බුත්තල කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය</u>

අක්කර 10 කින් සමන්විත මෙම ඉඩමේ කොම්පෝස්ට් පොහොර සකසා අලෙවි කිරීම සිදු කරනු ලබන අතර සමාලෝචිත වර්ෂය තුල නිෂ්පාදනය කළ ප්‍රමාණය කිලෝග්‍රෑම් 87,650 ක් විය. කෙසේ වුවද මෙම නිෂ්පාදන සඳහා ප්‍රමිති සහතිකයක් ලබාගෙන නොතිබුණි.

(iii) දෙහිවල පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි සැල

දෙහිවල අලෙවි සැලේ ලාභය පෙර වර්ෂයට වඩා සියයට 83 කින් අඩු වී තිබුණි. විකුණුම් ආදායම රු. 2,005,531 කින් අඩුවීම සහ වර්ෂය තුල පොදුකාර්ය වියදම රු.424,755 කින් වැඩිවීම මෙයට හේතු වී තිබුණි.

(iv) හෙල්දි ඉඩ භෝජනාගාරය

- වසවිස වලින් තොර පාරම්පරික දේශීය ආහාර පරිභෝජන රටාවක් ඇති කිරීමේ අරමුණින් නාරහේන්පිට ප්‍රදේශයේ ආරම්භ කරන ලද හෙල්දි ඉඩ භෝජනාගාරයේ එවැනි ආහාර අලෙවි කිරීමක් කර නොතිබුණි. එහි ආදායම් හා වියදම් තත්ත්වය සැලකීමේදී 2012 වර්ෂයේදී රු. 406,765 ක් වූ අලාභය ක්‍රමයෙන් වැඩි වී 2015 වර්ෂයේදී රු.4,192,533 ක්වූ අතර 2016 වර්ෂයේදී රු.3,812,515 ක් විය.

- මෙම භෝජනාගාරයේ සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාව අනුව මිල දී ගෙන තිබූ ද්‍රව්‍ය හා පිළියෙල කරන ලද ආහාර අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

ද්‍රව්‍ය	ප්‍රමාණය	සැකසිය හැකි ආහාර (පැකට් ගණන)	සකසා තිබූ ආහාර (පැකට් ගණන)	විචලනය
	කි.ග්‍රෑ			
හාල්	1762	10,551	7,233	3,318
මාළු	210	5,215	1,945	3,461
මස්	188	2,774	1,046	1,728

(v) නාරාහේන්පිට පැළ තවාන

මෙම පැළ තවානේ ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් පැළ වර්ග අලෙවි කිරීමෙන් ලබා ගන්නා අතර 2016 අගෝස්තු 08 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දී පැළ වර්ග හයක භෞතික ශේෂය හා තොග ලේඛනයේ ශේෂය අතර වටිනාකම රු.14,425 ක් වූ පැල 102 ක ඌනතාවයක් පැවතුණි.

(vi) සහල්පිටි පුවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - කලංකුට්ටිය

සමාලෝචිත වර්ෂය තුල මෙම ව්‍යාපෘතිය රු.226,394 ක අලාභයක් ලබා තිබු අතර මුළු පිරිවැයෙන් සියයට 83 ක් වැටුප් දීමනා සඳහා වැයකර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ පනත සඳහා සංශෝධන ඉදිරිපත් කරන ලෙස 2012 ඔක්තෝබර් 01 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝගයක් ලබා දී තිබූ අතර එම නියෝගය මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී නාරාහේන්පිට අලෙවිසැලේ සිදු වී තිබූ රු. 77,352 ක මුදල් සොරකම සම්බන්ධයෙන් චෝදනා පත්‍ර කෙටුම්පත හා මූලික විමර්ශන වාර්තා 2015 මැයි 5 දින ලබා දී තිබුණද විගණිත දිනය වූ 2017 මැයි 25 දින වන විටත් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල දී හෙල්දි ෆුඩ් භෝජනාගාරයේ සිදු වූ රු.73,415 ක වංචාව සම්බන්ධයෙන් 2016 ජූලි 28 දින කෘෂිකර්ම අමාත්‍යාංශයේ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කල මූලික විමර්ශනය අනුව එම මුදල අදාල සේවකයින් ගෙන් අයකරගන්නා ලෙස නිර්දේශ කර තිබුණ ද 2017 මැයි 25 දින දක්වාම එම මුදල අයකර ගෙන නොතිබුණි.

4.3 ආර්ථික නොවූ ගනුදෙනු

කොළඹ පවත්වන ලද වස විස නැති ජාතික පොළ ප්‍රදර්ශනය සඳහා නාමපුවරු, තොරතුරු පුවරු, ලෝගෝ සහ ප්‍රදර්ශන වියදම් ලෙස රු.486,110 ක් මණ්ඩලය විසින් වැය කර තිබුණි. එම ප්‍රදර්ශනය සඳහා භාවිතා කළ නාමපුවරු, තොරතුරු පුවරු සහ ප්‍රදර්ශන පුවරු අම්පාර දිස්ත්‍රික්කයේ පැවත් වූ දෙවන ප්‍රදර්ශනය සඳහා යොදා ගැනීමේ හැකියාව තිබියදී ඒ වෙනුවෙන් නැවත රු.550,000 ක් වියදමක් දරා තිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

මණ්ඩලයේ අරමුණින් බැහැරව පොහොර සහනාධාර මුදල් ප්‍රදානය කිරීමේ ජාතික වැඩසටහන සඳහා'' ගොවිතැනට හරි මහක්'' යන තේමාව යටතේ පුවත්පත් දැන්වීම් 7 ක් සහ රූපවාහිනී වැඩසටහන සජීවී විකාශනය සඳහා රු.1,878,318 ක් ද "ගම් දොර" වැඩසටහනට අදාල මාධ්‍ය ප්‍රචාරණය වෙනුවෙන් පුවත්පත් 8 ක දැන්වීම් පලකිරීම සඳහා රු.2,543,200 ක් ද වැයකර තිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙහිවල අලෙවි සැලෙහි බේකරියක් පවත්වාගෙන යාම සඳහා 2012 වර්ෂයේ මිලදීගෙන තිබූ රු.452,000 ක් වටිනා යන්ත්‍ර 2 ක් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි කිරීමේ ගිණුම් 03 ක පවතින රු.806,008 ක මුදල ඵලදායී ආයෝජන මාර්ගයක ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය 28 ක් වුව ද, 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර සේවකයින් 43 ක් බඳවා ගැනීම් හේතුවෙන් තථ්‍ය කාර්ය මණ්ඩලය 71 ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 7 වන ඡේදය ප්‍රකාරව 2014 නොවැම්බර් 12 න් පසුව තාවකාලික, අනියම්, ආදේශක කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගත යුත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියෙන් පසුව වුවද මීට පටහැනිව කොන්ත්‍රාත් සහ දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයින් 04 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඇ) නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුර උසස් කිරීමේ ශ්‍රේණියක් ලෙස බඳවාගත යුතු බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර තිබුණද , සමාලෝචිත වර්ෂය තුළ නියෝජ්‍ය අධ්‍යක්ෂක (සංවර්ධන) බාහිරින් බඳවා ගැනීම සඳහා රු.43,412 ක මුදලක් වැයකර පුවත්පත් දැන්වීමක් පලකර සම්මුඛ පරීක්ෂණයක් ද පවත්වා තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් සහ වියදම්, තථ්‍ය ආදායම් සහ වියදම් සමඟ සැසඳීමේදී සියයට 15 සිට 98 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් අයිතම 5 ක් සඳහා රු.26,117,000 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද මිලදී ගැනීම් සිදුකර නොතිබුණු අතර අයිතම 3 ක් සඳහා රු.3,310,000 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද රු.878,860 ක මිලදී ගැනීම් පමණක් සිදුකර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) මූල්‍ය පාලනය	අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර විචලනයන් අනාවරණය වීම හා ණය නිරවුල් කිරීමට කටයුතු නොකිරීම.
(ආ) වත්කම් පාලනය	වාහන විධිමත් ලෙස පවරා ගෙන නොතිබීම.
(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස බඳවා ගැනීම.
(ඈ) ව්‍යාපෘති කළමනාකරණය	ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම සහ දිගින් දිගට ක්‍රියාත්මක වන ව්‍යාපෘති අලාභ ලැබීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති